# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/36 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 11/2007

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 1ආ වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 95 වන වගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බැසිල් රෝහණ රාජපක්ෂ,<br>
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 15 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 1 දරන ගොවිජන සංවර්ධන (වන්දි ගෙවීම්) නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින් මතු "අඳ ගොවියා" යනුවෙන් හඳුන්වනු ලබන) පනතේ 1අ වගන්තියේ විධිවිධාන ප්‍රකාර අඳ ගොවියකු වශයෙන් සලකනු ලබන තැනැත්තකු විසින්, පනතේ 1ආ වගන්තියේ විධිවිධාන යටතේ වන්දි ගෙවනු ලැබීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර, අඳ ගොවියා විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල සත්‍යභාවය තහවුරු කිරීම සැලකිල්ලට ගෙන වන්දි ගෙවීම පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු ය.

(2) පනතේ 1ආ වගන්තිය යටතේ අඳ ගොවියාට වන්දි ගෙවිය යුතු බව කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබුවහොත් පනතේ විධිවිධානවලට යටත්ව පහත පදනම මත එම අඳ ගොවියා වෙත වන්දි ගෙවීම සඳහා ඔහු විසින් නියමයක් කරනු ලැබිය යුතු ය.

(අ) අදාළ කුඹුරු ඉඩම් ප්‍රමාණය වගා කරන ලද කන්න ගණන ;

(ආ) අදාළ කුඹුරු ඉඩම් ප්‍රමාණය වගා කිරීම සඳහා අඳ ගොවියා විසින් දරනු ලැබීමට අපේක්ෂිත වූ වියදම අඩු කිරීමෙන් පසු අදාළ කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබූ අස්වැන්න :


1A - PG 001584 — 3,830 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුව ද ගෙවිය යුතු උපරිම වන්දි මුදල එක් අක්කරයක් සඳහා රුපියල් ලක්ෂ දෙකක් විය යුතු ය. ඃ

එසේම තවදුරටත් වන්දි ගෙවනු ලැබීම සඳහා ගණනය කරනු ලබන කාලසීමාව අවුරුදු දහයක් නොඉක්මවිය යුතු ය.

3. පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමියා වෙත අඳ ගොවියා විසින් ගෙවිය යුතු බද්ද හිඟව පවතින අවස්ථාවක දී, එසේ බද්ද නොගෙවන ලද කන්න ගණනට සාපේක්ෂව වන්දි මුදල අඩු කළ යුතු ය.

4. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් වන්දි ගෙවීම් සඳහා නියමයන් කරනු ලැබූ අඳ ගොවීන්ගේ නම් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කළ යුතු අතර, ඒ පිළිබඳ විරෝධතා ඇත්නම්, ඒ නියමය කරනු ලැබූ දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයාට වෙත එම විරෝධතා ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(2) එවැනි නියමයක් සඳහා යම් විරෝධතාවයක් ඇත්නම් කොමසාරිස් ජනරාල්වරයා විසින් එම නියමයට විරෝධතාවය කරනු ලැබූ දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත එම නියමය ස්ථිර කරමින් හෝ සංශෝධනය කරමින් තම තීරණය ලබා දිය යුතු ය.

(3) (1) වැනි ඡේදය යටතේ භාර දෙන ලද විරෝධතාවයක් මත (2) වැනි ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුගේ තීරණය ලබාදෙන තෙක්, 2 වැනි නියෝගය යටතේ කරන ලද නියමය ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

5. මෙම නියෝගවල -

"පනත" යන්නෙන් 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් පනතේ 38 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

03-1148/1

---

එල්.ඩී.බී. 11/2007.

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 1ඉ වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 95 වැනි වගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බැසිල් රෝහණ රාජපක්ෂ,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 1 දරන ගොවිජන සංවර්ධන (අනුප්‍රාප්තිකයන් නම් කිරීමේ) නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

2. (1) පනතේ 1ඉ වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර අඳ ගොවියකුගේ අයිතිවාසිකම් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ ලේඛනය මෙහි උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

2. පනතේ 1ඉ වගන්තියේ (2) වැනි උපවගන්තිය ප්‍රකාර අඳ ගොවියකුගේ අයිතිවාසිකම් සඳහා අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම අවලංගු කිරීමේ ලේඛනය මෙහි උපලේඛනයේ දක්වා ඇති "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(3) පනතේ 1ඉ වගන්තියේ (2) වැනි උපවගන්තියේ නියමයන් ප්‍රකාර අඳ ගොවියකුගේ අයිතිවාසිකම් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීමේ හා ඒ වෙනුවට අලුත් අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ ඒකාබද්ධ ලේඛනය මෙහි උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

3. අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ, එවැනි නම් කිරීමක් අවලංගු කිරීමේ හෝ නම් කිරීමක් අවලංගු කොට අලුත් නම් කිරීමක් සිදු කිරීමේ කාර්යය සඳහා ලියා අත්සන් කරන ලද 5 වැනි නියෝගයේ සඳහන් යම් ලේඛනයක් පනතේ 1ඉ වගන්තියේ (5) වැනි උපවගන්තියේ නියමයන් ප්‍රකාර ලියාපදිංචි කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහු විසින් එවැනි සෑම ලේඛනයක්-

(අ) අනුක්‍රමිකව අංකනය කරවීමට ද ;
(ආ) කොමසාරිස් ජනරාල්වරයාගේ නිල මුද්‍රාවෙන් මුද්‍රා තබනු ලැබීමට ද ; සහ
(ඇ) මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කරවීමට ද,

කටයුතු සැලැස්විය යුතු ය.

4. කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් -

(අ) පනතේ 1ඉ වගන්තියේ (5) වැනි උපවගන්තියේ නියමයන් ප්‍රකාරව ලියාපදිංචි කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද සහ 5 වැනි නියෝගයේ සඳහන් යම් ලේඛනයක විස්තර ඇතුළත් (මෙහි මින් මතු "දෛනික පොත" යනුවෙන් හඳුන්වනු ලබන) දෛනික පොතක් ; සහ

(ආ) පනතේ 1 ඉ වගන්තියේ නියමයන් ප්‍රකාරව අඳ ගොවියන් විසින් නම් කරන ලද (මෙහි මින් මතු "අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන) අඳ ගොවියන්ගේ අනුප්‍රාප්තිකයන්ගේ නම් ඇතුළත් නාම ලේඛනයක්,

තබා ගැනීම ද පවත්වා ගෙන යාම ද කරනු ලැබිය යුතු ය.

5. (1) (අ) දෛනික පොත මෙහි උපලේඛනයේ දක්වා ඇති "ඈ" ආකෘතියට සාරානුකූල විය යුතු ය;

(ආ) පනතේ 1 ඉ වගන්තියේ (5) වැනි උපවගන්තියේ නියමයන් ප්‍රකාරව ලියපදිංචි කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද සෑම ලේඛනයක් ම එසේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද දිනය හා වේලාව දෛනික පොතේ ඇතුළත් විය යුතු ය.

(2) පනතේ 1 ඉ වගන්තියේ (5) වැනි උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් ඇතුළත් ලියුම් කවරයක් විවෘත කරනු ලබන දිනය හා වේලාව වශයෙන් දෛනික පොතේ සඳහන් වී ඇති දිනය හා වේලාව එම ලේඛනය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද දිනය හා වේලාව වශයෙන් සලකනු ලැබිය යුතු ය.

6. (1) අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනය-

(අ) මෙහි උපලේඛනයේ දක්වා ඇති "ඉ" ආකෘතියට සාරානුකූල විය යුතු ය ;

(ආ) කුඹුරු ඉඩම්වල විෂම වූ කොට්ඨාස සම්බන්ධයෙන් පොත් කිහිපයකින් සහ අවශ්‍ය විය හැකි පරිදි වෙළුම් ගණනකින් සමන්විත විය හැකි ය.

(2) පනතේ 1ඉ වගන්තියේ (5) වැනි උපවගන්තිය ප්‍රකාර, ලියාපදිංචි කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක්, එම ලේඛනය අදාළ වන කුඹුරු ඉඩම සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටි කොට්ඨාසය සඳහා වෙන් කරනු ලැබ ඇති අනුප්‍රාප්තිකයන්ගේ නාමලේඛනයේ අදාළ පොතෙහි හා වෙළුමෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ලියාපදිංචි කිරීම සඳහා වන ලේඛනය අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීමේ කාර්යය සඳහා හෝ අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම අවලංගු කිරීමේ හා අලුත් අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ කාර්යය සඳහා ලියා අත්සන් කර ඇති විට, එම ලේඛනය, පළමුවෙන් අනුප්‍රාප්තිකයකු නම් කිරීම සඳහා ලියා අත්සන් කරන ලද ලේඛනය ලියාපදිංචි කරන ලද අදාළ පිටුවෙන් ඉදිරියට ගෙන ගිය පිටුවේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

එසේ ම තවදුරටත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන්නේ නම් එවැනි යම් ලේඛනයක් අලුත් පිටුවක ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර එම කුඹුරු ඉඩම හා අදාළ යම් මුල් නම් කිරීමක් පිළිබඳ ලේඛනයක පූර්ව ලියාපදිංචිය සම්බන්ධයෙන් හරස් සටහනක් යෙදිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීම සඳහා වන ලේඛනයට අදාළ කුඹුරු ඉඩම සම්බන්ධයෙන් කලින් කිසිදු ලේඛනයක් ලියාපදිංචි කර නොමැති විටක, එම ලේඛනය එම කුඹුරු ඉඩම සඳහා වෙන් කරන ලද අලුත් පිටුවක ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(4) පනතේ 1 ඉ වගන්තියේ (5) වැනි උප වගන්තියේ නියමයන් ප්‍රකාර කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලද විටක, කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනයේ අදාළ සටහන් යොදනු ලැබ එම සටහන් අත්සන් කර එම ලේඛනය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. අදාළ ලේඛනය ලියාපදිංචි කරනු ලැබ ඇති පොත, වෙළුම හා පිටුව ද ලියාපදිංචි කරන ලද ස්ථානය හා දිනය ද එම ලේඛනයේ පිටපත් දෙකෙහි මෙහි පහත දැක්වෙන ආකාරයට පිටසන් කිරීම කරනු ලැබිය යුතු ය.

(පොත් අංකය හා වෙළුමේ අංකය) හි ලියාපදිංචි කරන ලදී.

2013............ දින කොළඹ දී ය.

....................................
(කොමසාරිස් ජනරාල්වරයාගේ/කොමසාරිස් ජනරාල්වරයා
විසින් බලය පවරනු ලැබූ නිලධරයාගේ අත්සන.)

7. අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනයෙහි ලියාපදිංචි කිරීම සඳහා පනතේ 1ඉ වගන්තියේ (5) වැනි උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයක සඳහන් යම් කුඹුරු ඉඩමක විස්තරය, එම කුඹුරු ඉඩම සම්බන්ධයෙන් අනුප්‍රාප්තිකයන්ගේ නාමලේඛනයෙහි යම් පූර්ව ලියාපදිංචි කිරීමක දැනටමත් ඇතුළත් කර ඇති විස්තරයට වෙනස් වන්නා වූ විට, ඒ ලේඛනය පූර්ව ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබූ ඉඩම සම්බන්ධයෙන් අදාළ වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසු, එම ලේඛනය එම කුඹුරු ඉඩම සම්බන්ධයෙන් පූර්ව ලියාපදිංචි සිදු කර ඇති පිටුවෙහි ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

8. දෛනික පොතෙහි සඳහන් කර ඇති පරිදි පනතේ 1ඉ වගන්තියේ (5) වැනි උපවගන්තිය යටතේ යම් ලේඛනයක් භාර දෙන ලද දිනය හා වේලාව, එම ලේඛනය අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනයේ ලියාපදිංචි කරන ලද දිනය හා වේලාව වශයෙන් සලකනු ලැබිය යුතු ය .

9. (1) මෙම නියෝගවල මෙම කොටසේ විධිවිධාන ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරන ලද ලේඛන පිළිබඳ වාර්තා පරීක්ෂා කිරීමට යම් තැනැත්තකු අදහස් කරනු ලබන විට -

(අ) ඔහු විසින් පහත විස්තර ඇතුළත් කර ලිඛිත ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.:-

(i) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ;
(ii) කුඹුරු ඉඩමේ නම සහ ප්‍රමාණය ;
(iii) කුඹුරු ඉඩම පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ගම හෝ නගරය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ;
(iv) කුඹුරු ඉඩමේ මායිම් ; සහ

(ආ) රුපියල් පහක වටිනාකමින් යුත් ඇලවිය හැකි මුද්දර ඉල්ලුම් පත්‍රයෙහි අලවනු ලැබීමෙන් ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්, පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අවස්ථාවේ දී එම මුද්දර අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලුම්කරු විසින් අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනය පරීක්ෂා කිරීම කොමසාරිස් ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයකු ඉදිරිපිටදී හෝ හැර සිදු නොකළ යුතු ය.

10. මෙම නියෝගවල -

"පනත" යන්නෙන් 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත අදහස් වේ.

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් පනතේ 38 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

**උපලේඛනය**

2(1) වැනි නියෝගය.

***"අ" ආකෘතිය***

*අනුප්‍රාප්තිකයා නම් කිරීමේ ලේඛනය*

මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, ................................................................ හි පදිංචි...............................ට දැනට අයත් වූ ද, .................. නමැති කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා වන.......... පදිංචි.......... වන මම, 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ, යථෝක්ත කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් මගේ අයිතිවාසිකම්වලට, මා පූර්ණ අබලතාවයට පත්ව සිටින බැවින්/මගේ මරණයෙන් පසු, අනුප්‍රාප්ත වීමට හිමිකම් ලැබිය යුතු මගේ අනුප්‍රාප්තිකයා වශයෙන්................ පදිංචි...............................මෙයින් නම් කරමි.

.............................
අඳ ගොවියාගේ අත්සන.

සාක්ෂිකරුවන් දෙදෙනාගේ නම් සහ ලිපිනය :

1........................ අත්සන : .............................
2........................ අත්සන : .............................
2013..................... මස............ දින................. දී මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

.............................................
පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සමාදාන විනිශ්චයකාර.

**උපලේඛනය**

1. කුඹුරු ඉඩමේ නම :...................................
2. කුඹුරු ඉඩමේ පිහිටීම :...................................
3. (අ) ගම හෝ නගරය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය :...................................
   (ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...................................
   (ඇ) පරිපාලන දිස්ත්‍රික්කය :...................................
4. කුඹුරු ඉඩමේ මායිම් :
   උතුරට :...................................
   දකුණට :...................................
   නැගෙනහිරට :...................................
   බටහිරට :...................................
5. ප්‍රමාණය :...................................
6. අදාළ කොටස :...................................
7. කුඹුරු ඉඩම සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම පිහිටි කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර බල ප්‍රදේශය :...................................
8. ගොවිජන සංවර්ධන සභාවේ නම :...................................

2(2) වැනි නියෝගය.

*"ආ" ආකෘතිය*

*අනුප්‍රාප්තිකයා නම් කිරීම අවලංගු කිරීමේ ලේඛනය*

මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, ............................හි පදිංචි............................ට දැනට අයත් වූ ද,............................නම් කුඹුරු ඉඩමේ අඳ ගොවියා වන............................පදිංචි............................වන මම, 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ, යථෝක්ත කුඹුරු ඉඩමේ අඳ ගොවියා වශයෙන් මගේ අයිතිවාසිකම්වලට, මා පූර්ණ අබලතාවයට පත්ව සිටින බැවින්/මගේ මරණයෙන් පසු, අනුප්‍රාප්ත වීමට හිමිකම් ලැබිය යුතු මගේ අනුප්‍රාප්තිකයා වශයෙන්............................ පදිංචි............................ නම් කරමින්............................දී............................ ඉදිරියේ දී 20.. වන දින මවිසින් ලියා අත්සන් කරන ලද ලියවිල්ලෙන් මවිසින් කරන ලද නම් කිරීම මෙයින් අවලංගු කරමි.

.............................
අඳ ගොවියාගේ අත්සන,

සාක්ෂිකරුවන් දෙදෙනාගේ නම් සහ ලිපිනය ׃

1........................ අත්සන ׃ .............................
2........................ අත්සන ׃ .............................
2013..................... මස............ දින................. දී මා ඉදිරිපිට අත්සන් තබන ලදී.

.............................................
පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සමාදාන විනිශ්චයකාර.

**උපලේඛනය**

1. කුඹුරු ඉඩමේ නම ׃...................................
2. කුඹුරු ඉඩමේ පිහිටීම ׃...................................
   (අ) ගම හෝ නගරය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ׃...................................
   (ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ׃...................................
   (ඇ) පරිපාලන දිස්ත්‍රික්කය ׃...................................
3. කුඹුරු ඉඩමේ මායිම් ׃-
   උතුරට ׃...................................
   දකුණට ׃...................................
   නැගෙනහිරට ׃...................................
   බටහිරට ׃...................................
4. ප්‍රමාණය ׃...................................
5. අදාළ කොටස ׃...................................
6. කුඹුරු ඉඩම සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම පිහිටියේ කිනම් කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර බලප්‍රදේශයක ද වන වග ׃...................................
7. ගොවිජන සංවර්ධන සභාවේ නම ׃...................................

2(3) වැනි නියෝගය.

*"ඇ" ආකෘතිය*

*අනුප්‍රාප්තිකයා නම් කිරීම අවලංගු කිරීම සහ නව අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමේ ඒකාබද්ධ ලේඛනය*

මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, ............ පදිංචි............ ට දැනට අයත් වූ ද, ............................නමැති කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා වන............ පදිංචි................ වන මම මෙයින්-

(අ) 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ මගේ අයිතිවාසිකම්වලට, මා පූර්ණ අබලතාවයට පත්ව සිටින බැවින්/ මගේ මරණයෙන් පසු, අනුප්‍රාප්ත වීමට හිමිකම් ලැබිය යුතු මගේ අනුප්‍රාප්තිකයා වශයෙන්........................ පදිංචි........................නම් කරමින්............ දි ........................ඉදිරියේ දී 20............මස............වැනි දින මවිසින් ලියා අත්සන් කරන ලද, ලියවිල්ලෙන් මවිසින් කරන ලද නම් කිරීම අවලංගු කරමි. තව ද,

(ආ) එකී පනත යටතේ, යථෝක්ත කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් මගේ අයිතිවාසිකම්වලට, මා පූර්ණ අබලතාවයට පත්ව සිටින බැවින්/මගේ මරණින් පසු, අනුප්‍රාප්ත වීමට හිමිකම් යුතු මගේ අනුප්‍රාප්තිකයා වශයෙන්............ පදිංචි............නම් කරමි.

.....................................
අඳ ගොවියාගේ අත්සන,

දිනය :.........................
සාක්ෂිකරුවන් දෙදෙනාගේ නම් සහ ලිපිනය :

1......................... අත්සන : .............................
2......................... අත්සන : .............................
2013...................... මස............. වැනි දින.................. දී මා ඉදිරිපිට අත්සන් තබන ලදී.

.............................................
පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති/
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සමාදාන විනිශ්චයකාර.

***උපලේඛනය***

1. කුඹුරු ඉඩමේ නම :...........................................
2. කුඹුරු ඉඩමේ පිහිටීම :...........................................
   (අ) ගම හෝ නගරය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය :...........................................
   (ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...........................................
   (ඇ) පරිපාලන දිස්ත්‍රික්කය :...........................................
3. කුඹුරු ඉඩමේ මායිම් :

   උතුරට :...........................................

   දකුණට :...........................................

   නැගෙනහිරට :...........................................

   බටහිරට :...........................................
4. ප්‍රමාණය :...........................................
5. අදාළ කොටස :...........................................
6. කුඹුරු ඉඩම සම්පූර්ණ වශයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම පිහිටියේ කිනම් කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර බල ප්‍රදේශයේ ද යන වග :...........................................
7. ගොවිජන සංවර්ධන සභාවේ නම :...........................................

5(1) වන නියෝගය.

***"ඈ" ආකෘති පත්‍රය***

දෛනික පොත

| *අනුක්‍රමික අංකය* | *ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ දිනය හා වේලාව* | *ලේඛනය ලියා අත්සන් කළ දිනය හා එය කවරෙකු ඉදිරියේ ලියා අත්සන් කළේද යන වග* | *ලේඛනයේ ස්වභාවය නම් කිරීම ද අවලංගු කිරීම ද නැතහොත් අවලංගු කිරීම හා නම් කිරීම ද යනවග* | *ලියාපදිංචි කිරීම සහ ගාස්තුව* | *අදාළ ඉඩම් ගණන* | *අදාළ කොටස* | *ලියාපදිංචි කිරීමෙන් පසු ලේඛනය ආපසු යැවූ දිනය* | *වෙනත් කරුණු ඇතොත් ඒවා* |
|---|---|---|---|---|---|---|---|---|
| *1* | *2* | *3* | *4* | *5* | *6* | *7* | *8* | *9* |
| | | | | | | | | |

6(1) වන නියෝගය.

***"ඉ" ආකෘති පත්‍රය***

*අනුප්‍රාප්තිකයන්ගේ නාම ලේඛනය*

1. ගොවිජන සේවා මධ්‍යස්ථානය :...............................
2. සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටියේ කිනම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර බල ප්‍රදේශයේ ද යන වග :...............................
3. ගම හෝ නගරය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය :...............................
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...............................
5. පරිපාලන දිස්ත්‍රික්කය :...............................
6. කුඹුරු ඉඩමේ නම :...............................
7. මායිම්-

   උතුරට :...............................

   දකුණට :...............................

   නැගෙනහිරට :...............................

   බටහිරට :...............................

8. ප්‍රමාණය :...............................

| අනුක්‍රමික අංකය | ලියාපදිංචි කළ දිනය | අයිතිකරුගේ නම සහ ලිපිනය | අද ගොවියාගේ නම සහ ලිපිනය | පනතේ 1ඉ වගන්තිය යටතේ නම් කරන ලද අනුප්‍රාප්ති-කයාගේ නම සහ ලිපිනය | පනතේ 1ඉ වගන්තිය යටතේ නම් කිරීම අවලංගු කළ අනුප්‍රාප්තිකයාගේ නම සහ ලිපිනය | අදාළ කොටස | ලේඛනය ලියා අත්සන් කළ දිනය සහ එය අත්සන් කළේ කවරකු ඉදිරියේ ද යන වග | කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ බලයලත් නිලධාරයාගේ අත්සන | වෙනත් කරුණු ඇතොත් ඒවා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| | | | | | | | | | |

03-1148/2

---

එල්.ඩී.බී. 11/2007.

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 39 වැනි වගන්තියේ (11) වැනි උපවගන්තිය හා 42 අ වගන්තියේ (13) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 95 වැනි වගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බැසිල් රෝහණ රාජපක්ෂ,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 1 දරන ගොවිජන සංවර්ධන (පරීක්ෂණ පරිපාටිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වැනි කොටස**

***ගොවිජන විනිශ්චය සහා පරීක්ෂණ පරිපාටිය***

2. යම් ඉල්ලීමක්, පැමිණිල්ලක් හෝ අභියාචනයක් පරීක්ෂණය සඳහා ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කරනු ලැබූ විට කොමසාරිස් ජනරාල්වරයා විසින් එක් එක් පරීක්ෂණය සඳහා දී ඇති පරීක්ෂණ අංකය, පරීක්ෂණයේ නිශ්චිත අංකය වශයෙන් ගොවිජන විනිශ්චය සභාව විසින් යොදාගත යුතු අතර, යොමු කිරීමේ අනුපිළිවෙල අනුව පරීක්ෂණය පැවැත්විය යුතු ය.

3. (1) ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කරන ලද හෝ කරන ලද ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් මෙහි උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර එය දිවුරුම් පෙත්සමක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(2) ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කරන ලද හෝ කරන ලද අභියාචනයක් මෙහි උපලේඛනයේ "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර එය දිවුරුම් පෙත්සමක් සමග ඉදිරිපත් කළ යුතු ය.

4.පරීක්ෂණය පැවැත්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින දාහතරකට පෙර ලිඛිත දැන්වීමක් ඉල්ලීමේ, පැමිණිල්ලේ හෝ අභියාචනයේ පාර්ශ්වකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු අතර පරීක්ෂණයට පැමිණ සිටින ලෙස එයින් නියම කළ යුතු ය.

5. 4 වැනි නියෝගය යටතේ යවනු ලබන දැන්වීමෙහි, පරීක්ෂණයේ විෂයය, පාර්ශ්වයන්ගේ නම් හා ලිපිනයන්, පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය සඳහන් කරනු ලැබිය යුතු ය.

6. 4 වැනි නියෝගය යටතේ යවනු ලබන දැන්වීමෙහි සඳහන් නියමිත දිනයේ දී හා වේලාවේ දී යම් පාර්ශ්වයක් නොපැමිණයහොත්, පනතේ 39 වැනි වගන්තියේ (8) වැනි උපවගන්තියේ විධිවිධාන නොතකා පරීක්ෂණය වෙනත් දිනයකට කල්තබා එම පරීක්ෂණය නැවත පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය පාර්ශ්වකරුවන්ට ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතු ය.

7. පරීක්ෂණය සඳහා නියමිත දිනයේ දී සාධාරණ හේතුවක් නොදක්වා ඉල්ලුම්කරු, පැමිණිලිකරු හෝ අභියාචක නැතහොත් ඔහුගේ නියෝජිතයකු නොපැමිණියහොත්, පැමිණිල්ල නිෂ්ප්‍රභ කරන බව ද, එම දිනයේ දී සාධාරණ හේතුවක් නොදක්වා වගඋත්තරකරු හෝ ඔහුගේ නියෝජිතයකු නොපැමිණියහොත් ඒක පාක්ෂිකව පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරන බව ද, 6 වැනි නියෝගයේ සඳහන් දැන්වීමෙහි සඳහන් කළ යුතු ය.

8. රජයේ නිවාඩු දිනයක දී කිසිම පරීක්ෂණයක් නොපැවැත්විය යුතු ය.

9. එක් එක් දිනයේ පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පෙර, පරීක්ෂණය හා සම්බන්ධ කරුණු පිළිබඳ ජර්නල් සටහනක් කළ යුතු ය.

10. ගොවිජන විනිශ්චය සභාව මුල් අවස්ථාවේ දී පාර්ශ්වයන් අතර සමථයක් කිරීමට උත්සාහ කළ යුතු ය. සමථයක් කිරීමට නොහැකි වුවහොත් පමණක් පරීක්ෂණය ආරම්භ කළ යුතු ය.

11. ඉල්ලීම, පැමිණිල්ල හෝ අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී ඒ ඉල්ලීමට ගොවිජන විනිශ්චය සභාව විසින් අවසර දෙනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී ගොවිජන විනිශ්චය සභාව විසින් තම අභිමතය පරිදි ඉල්ලුම්කරුට, පැමිණිලිකරුට හෝ අභියාචකට අනෙක් පාර්ශ්වය වෙත නඩු ගාස්තු ගෙවන ලෙස නියම කළ හැකි ය.

12. මෙහි උපලේඛනයේ"ඇ" ආකෘතියට සාරානුකූල ලේඛනයකින් පත් කරනු ලබන තමාගේ නියෝජිතයෙකු මගින් හෝ පෞද්ගලිකව යම් පරීක්ෂණයක දී පාර්ශ්වකරුවෙකුට කරුණු ඉදිරිපත් කිරීමට හැකි ය.

13. 13 වැනි නියෝගයේ නියමයන් ප්‍රකාරව කරනු ලබන පත්කිරීමක් මෙහි උපලේඛනයේ "ඈ" ආකෘතියට සාරානුකූල ලේඛනයකින් අවලංගු කරනු ලැබිය හැකි ය.

14.පරීක්ෂණයක දී පාර්ශ්වයන්ට සාක්ෂි දිය හැකි අතර සාක්ෂිකරුවන් කැඳවීමට ඉල්ලීමක් කළ හැකි ය. සාක්ෂිකරුවන් කැඳවීමට ඉල්ලීම කරනු ලබන පාර්ශ්වකරුවන් විසින් සාක්ෂිකරුවන් කැඳවීමට කටයුතු කළ යුතු ය.

එසේ වුවද, ආදාළ පාර්ශ්වය විසින් යැපීම් මුදල ගෙවීමට යටත්ව, ගොවිජන විනිශ්චය සභාව විසින් යම් සාක්ෂිකරුවෙකු වෙත සිතාසි නිකුත් කළ හැකි ය.

15. සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි ලබාගැනීමෙන් අනතුරුව හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් දිය යුතු අතර, හරස් ප්‍රශ්නවලින් මතුවූ කරුණුවලට අදාළව පමණක් ඒ සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමට ඉඩදිය යුතු ය.

16. ගොවිජන විනිශ්චය සභාව විසින් අවශ්‍ය යයි සළකන කවර හෝ සාක්ෂි එය විසින් ලබාගත හැකි අතර යම් පාර්ශ්වකරුවෙකුට යම් කරුණක් පැහැදිලි කිරීමට අවසර දිය හැකි ය.

17. යම් පරීක්ෂණයක දී පාර්ශ්වකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකු හෝ සාක්ෂියක් ලබාදුනහොත්, එකී සාක්ෂිය සටහන් කොට, ඒ සාක්ෂිය දුන් තැනැත්තාට එකී සාක්ෂිය නැවත කියවා පැහැදිලි කර දීමෙන් පසුව, "මා වෙත කියවා තේරුම් කරදෙන ලදී" යන වචන එම සාක්ෂිය අවසානයේ ඇතුළත් කළ යුතු අතර සාක්ෂිය ලබාදුන් තැනැත්තාගේ අත්සන ලබාගත යුතු ය. ඉක්බිතිව, "මා ඉදිරිපිටදී අත්සන් කරන ලදී" යන වචන වලට පසුව ගොවිජන විනිශ්චය සභාව වශයෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තා විසින් අත්සන් කොට දිනය යෙදිය යුතු ය.

18. සාක්ෂිය දෙනු ලැබූ තැනැත්තා තම සාක්ෂිය කියවීමට අවසර ඉල්ලුවහොත් එයට ඉඩදෙනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවක ඔහු විසින් තම සාක්ෂිය අත්සන් කිරීමට පෙර "කියවා බලා තේරුම් ගෙන අත්සන් කළෙමි" යන වචන ඇතුළත් කළ යුතු අතර ගොවිජන විනිශ්වය සභාව විසින් එම ලේඛනය සහතික කළ යුතු ය.

19. පරීක්ෂණයක් කල් තබන අවස්ථාවක දී, පාර්ශ්වකරුවන්ට ඒ බව දැනුම් දී ජර්නල් සටහනට ඔවුන්ගේ අත්සන් ලබාගත යුතු ය.

20. දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් සාධාරණ හේතු මත කරන ඉල්ලීමක් අනුව ගොවිජන විනිශ්වය සභාව විසින් පරීක්ෂණය කල් තැබිය හැකි ය.

21. පරීක්ෂණය අවසානයේ දී පාර්ශ්වකරුවන්ට ලිඛිත හෝ වාචික දේශන ඉදිරිපත් කළ යුතු යැයි නියම කරනු ලැබිය හැකි ය. තවද ඒ බවට සටහනක් කළ යුතු ය.

22. පරීක්ෂණ ගොනුව ගොවිජන විනිශ්වය සභාව භාරයේ පවතින අවස්ථාවල දී පරීක්ෂණ කටයුතුවල සහතික පිටපත් ඉල්ලා සිටියහොත්, සහතික පිටපත් ලබාදීම සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු හා කුවිතාන්සි නිකුත් කිරීම නිශ්චිතව සඳහන් කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වලට අනුව අයකරනු ලබන යම් ගාස්තු ගෙවීම මත ගොවිජන විනිශ්වය සභාවේ ලේකම්වරයා විසින් එම පිටපත් නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

23. ගොවිජන විනිශ්වය සභාවේ තීරණය, කොමසාරිස් ජනරාල්වරයාට හා අදාළ පාර්ශ්වයන්ට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතු ය.

24. ගොවිජන විනිශ්වය සභාවේ තීරණය ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත පරීක්ෂනයේ යම් පාර්ශ්වයක් විසින් සමාලෝචන මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, අදාළ පරීක්ෂණයේ ලිපි ගොනුව කොමසාරිස් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

25. ගොවිජන විනිශ්වය සභාවේ තීරණය සම්බන්ධයෙන් නිශ්චිත කාලසීමාව ඇතුළත සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනයක් කරනු ලැබූ විට -

(අ) එම අභියාචනයේ පිටපත් කොමසාරිස් ජනරාල්වරයා වෙත සහ වගඋත්තරකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය ; සහ

(ආ) අදාළ පරීක්ෂණයේ ලිපි ගොනුව ගොවිජන විනිශ්වය සභාවේ ලේකම්වරයාගේ භාරයේ තබාගත යුතු ය.

26. ගොවිජන විනිශ්වය සභාවේ ලේකම්වරයා විසින් -

(අ) එම ගොවිජන විනිශ්වය සභාවේ නියම අදාළ පාර්ශ්වයන් වෙත දැනුම් දිය යුතු ය ;

(ආ) එම ගොවිජන විනිශ්වය සභාවේ වාර්තා, ලේඛන, ලිපිගොනු සහ සියලු උපකරණ ඔහුගේ භාරයේ තබාගත යුතු අතර, ඒවායේ ආරක්ෂාව පිළිබඳව ඔහු වගකිව යුතු ය ;

(ඇ) පරීක්ෂණ කටයුතු පිළිබඳ විස්තර ඇතුළත් පරීක්ෂණ ලිපිගොනුවක් පවත්වාගෙන යා යුතු ය ;

(ඈ) සහතික කළ පිටපත් සඳහා වන ඉල්ලීම් හැර අනෙකුත් සියලු ඉල්ලීම්, පැමිණිලි හා අභියාචනා පරීක්ෂණ ගොනුවේ ගොනු කළ යුතු ය ;

(ඉ) එම ගොවිජන විනිශ්වය සභාව වෙත කරන ලද හෝ යොමු කරන ලද ඉල්ලීම්, පැමිණිලි හා අභියාචනා සම්බන්ධයෙන් ගොවිජන විනිශ්වය සභාවේ විධානවලට අනුව ක්‍රියා කළ යුතු ය ;

(ඊ) පරීක්ෂණයක යම් පාර්ශ්වකරුවෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ සහතික පිටපත් ලබාදීම සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු හා කුවිතාන්සි නිකුත් කිරීම නිශ්චිතව සඳහන් කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව පනවන ලද යම් ගාස්තුවක් ගෙවීම මත ගොවිජන විනිශ්වය සභාව විසින් පවත්වන ලද යම් පරීක්ෂණයක කටයුතුවල සහතික පිටපත් නිකුත් කළ යුතු ය.

27. ගොවිජන විනිශ්වය සභාව මසකට යටත් පිරිසෙයින් දින පහළොවක්වත් රැස්වීම් පැවැත්විය යුතු ය.

28. ගොවිජන විනිශ්වය සභාවේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන චක්‍රලේඛ මගින් උපදෙස් ලබාදිය හැකි ය.

II වැනි කොටස

*සමාලෝචන මණ්ඩල පරිපාටිය*

29. සමාලෝචන මණ්ඩලය විසින් එක් එක් තෙමසක කාලය සඳහා එහි රැස්වීම් පැවැත්විය යුතු දින කලින් තීරණය කළ යුතු ය.

30. සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා විසින් එසේ නියම කරනු ලබන දින, අභියාචනා අංක හා පාර්ශ්වකරුවන්ගේ නම් ප්‍රදර්ශනය කළ යුතු ය.

31. යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන යම් ආරාවුලක පාර්ශ්වකරුවෙකු විසින් අනෙක් පාර්ශ්වය හෝ පාර්ශ්වයන් පෙත්සමේ වගඋත්තරකරු හෝ වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබිය යුතු ය.

32. ඕනෑම අභියාචනා පෙත්සමක් සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාරදිය යුතු ය.

33. සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් මෙහි උපලේඛනයේ "ඉ" ආකෘතියට සාරානුකුල විය යුතු අතර, එය දිවුරුම් පෙත්සමක් සමග ඉදිරිපත් කළ යුතු ය.

34. අභියාචනා පෙත්සමේ පිටපත් අභියාචක විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත හා වගඋත්තරකරු හෝ වගඋත්තරකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

35. සෑම අභියාචනා පෙත්සමක ම රු. 50.00 ක් වටිනා මුද්දර අලවා තිබිය යුතු ය.

36. සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා විසින් අභියාචනා පෙත්සම ලැබුණු දිනයේ දී එහි සෑම පිටුවක ම දින මුද්‍රාව තබා කෙටි අත්සන යෙදිය යුතු අතර, අභියාචනා පෙත්සම ලැබුණු දිනයේ සිට දින දාහතරක් ඇතුළත ඒ බව සමාලෝචන මණ්ඩලය වෙත දැනුම් දිය යුතු ය.

37. රුපියල් 50.00ක වටිනාකමින් යුත් මුද්දර අභියාචනා පෙත්සමට අලවා නොමැති නම්, සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා විසින් ඒ බව ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියකින් අභියාචක වෙත දැනුම් දිය යුතු අතර, රු. 50.00ක මුද්දර එකී ලිපිය ලැබුණු දිනයේ සිට දින දාහතරක් ඇතුළත පෙත්සමට අලවන ලෙස නියම කළ යුතු ය.

38. ලේකම්වරයා විසින් අභියාචනයට අදාළ පරීක්ෂණ ලිපි ගොනුව ගොවිජන විනිශ්චය සභාවෙන් ලබාගත යුතු ය.

39. අභියාචකට හෝ අවස්ථාවෝචිත පරිදි, වගඋත්තරකරුට හෝ වගඋත්තරකරුවන්ට පෞද්ගලිකව හෝ නියෝජිතයකු මගින් සමාලෝචන මණ්ඩලයට කරුණු කියා සිටිය හැකි ය.

40. අභියාචක හෝ යම් පාර්ශ්වකරුවකු විසින් සමාලෝචන මණ්ඩලය ඉදිරියේ ඔහු වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකු පත් කළ හැකි ය.

41. ගොවිජන විනිශ්චය සභාව ලෙස පත්කරන ලද යම් තැනැත්තකු සමාලෝචන මණ්ඩලය ඉදිරියට කැඳවනු නොලැබිය යුතු ය.

42. සමාලෝචන මණ්ඩලයේ බහුතර සාමාජිකයන්ගේ තීරණය සමාලෝචන මණ්ඩලයේ තීරණය ලෙස සලකනු ලැබිය යුතු ය.

43. සමාලෝචන මණ්ඩලය යම් අභියාචනයක් සම්බන්ධයෙන් තම තීරණය දීමේ දී එයට හේතු දැක්විය යුතු අතර එකී තීරණයට එකඟ නොවන සමාලෝචන මණ්ඩලයේ යම් සාමාජිකයෙකු විසින් එකඟ නොවීමට හේතු දැක්විය හැකි ය.

44. සමාලෝචන මණ්ඩලයේ තීරණය, ලේකම්වරයා විසින් ලියාපදිංචි තැපෑලෙන් අභියාචනයේ සෑම පාර්ශ්වකරුවකුට සහ කොමසාරිස් ජනරාල්වරයාට දැන්විය යුතු ය.

45. සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා විසින් -

(අ) එම සමාලෝචන මණ්ඩලයේ නියමයන් සෑම පාර්ශ්වකරුවකු වෙත දැනුම් දිය යුතු ය ;

(ආ) සමාලෝචන මණ්ඩලයේ වාර්තා, ලේඛන හා සියලු උපකරණ ඔහුගේ භාරයේ තබාගත යුතු ය ;

(ඇ) සමාලෝචන මණ්ඩලය විසින් කරන සියලුම අභියාචන විභාග කිරීමේ කටයුතු පිළිබඳ වාර්තා තබා ගත යුතු ය ;

(ඇ) සහතික කළ පිටපත් සඳහා වන ඉල්ලීම් හැර, සියලු අභියාචනා පෙත්සම් ගොනු කළ යුතු ය ;

(ඉ) සමාලෝචන මණ්ඩලය වෙත යොමු කරනු ලබන අභියාචනා පෙත්සම් සම්බන්ධයෙන් සමාලෝචන මණ්ඩලයේ විධාන අනුව ක්‍රියා කළ යුතු ය ; සහ

(ඊ) සමාලෝචන මණ්ඩලය විසින් යම් අභියාචනයක් විභාග කිරීමේ දී එකී අභියාචනය පිළිබඳ සහතික පිටපත් අභියාචනයේ යම් පාර්ශ්වකරුවකු විසින් ඉල්ලා සිටිවිට හා සහතික පිටපත් ලබාදීම සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු සහ කුවිතාන්සි නිකුත් කිරීම නිශ්චිතව සඳහන් කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව පනවනු ලබන යම් ගාස්තුවක් ගෙවනු ලැබූ විට එකී සහතික පිටපත් නිකුත් කළ යුතු ය.

46. අභියාචනයක් විභාග කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා හෝ අදාළ දිස්ත්‍රික්කයේ සහකාර කොමසාරිස්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත එවන ලද ලේඛන, එකී අභියාචනය විභාග කොට අවසන් කිරීමෙන් පසු දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා හෝ එම සහකාර කොමසාරිස්වරයා වෙත ආපසු යැවිය යුතු ය.

47. මෙම නියෝගවල-

"පනත" යන්නෙන් 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත අදහස් වේ.

"ගොවිජන විනිශ්චය සභාව" යන්නෙන් පනතේ 39 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ගොවිජන විනිශ්චය සභාව අදහස් වේ ;

"සමාලෝචන මණ්ඩලය" යන්නෙන් පනතේ 42 අ වගන්තියේ (5) වැනි උපවගන්තිය යටතේ පත් කරන ලද සමාලෝචන මණ්ඩලයක් අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් පනතේ 38 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

*උපලේඛනය*

3(1) වන නියෝගය.

**"අ" ආකෘතිය**

2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන විනිශ්චය සභාව වෙත කරනු ලබන/යොමු කරනු ලබන ඉල්ලීම/පැමිණිල්ල

......................................................................
......................................................................
......................................................................
ඉල්ලුම්කරු/පැමිණිලිකරු,

......................................................................
......................................................................
......................................................................
වග උත්තරකරු,

පරීක්ෂණ අංකය :...................................
(කොමසාරිස් ජනරාල්වරයා විසින් අංකය නියම කළ යුතු ය.)

(රු. 100 මුද්දර)
20 ................මස.................... දින කොළඹ දී ය.

1. ඉල්ලීම/පැමිණිල්ල කරනු ලබන්නේ හෝ යොමු කරනු ලබන්නේ 2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ කවර වගන්තිය/වගන්ති යටතේ ද යන්න :-
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................

2. ඉල්ලීමට/පැමිණිල්ලට පදනම් වූ කරුණු :
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................

3. ඉල්ලීම/පැමිණිල්ල සමග ඉදිරිපත් කරන ලේඛන :

   (i) ..........................................................................................................................................
   (ii) ..........................................................................................................................................
   (iii) ..........................................................................................................................................

4. කැඳවිය යුතු පාර්ශ්වය/පාර්ශ්වයන්
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................

...............................................
ඉල්ලුම්කරු/පැමිණිලිකරුගේ අත්සන.

3(2) වැනි නියෝගය.

**"ආ" ආකෘතිය**

***2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ.......................... වගන්තිය යටතේ........................... ගොවිජන විනිශ්චය සභාව වෙත කරනු ලබන අභියාචනය***

.......................................................................
.......................................................................
.......................................................................
අභියාචක

.......................................................................
.......................................................................
.......................................................................
වග උත්තරකරු,

ඉල්ලීමේ/පැමිණිල්ලේ අංකය :..................................

ගොවිජන විනිශ්චය සභාවේ
පරීක්ෂණ අංකය :..........................................
(කොමසාරිස් ජනරාල්වරයා වරයා විසින් අංකය නියම කළ යුතු ය.)

(රු. 100 මුද්දර)
20 .....................ක් වූ ............................. මස
........................................දින දීය.

1. ................................................................................................................................................................... පදිංචි ..................................................................................................................................................................................... වන මම, 2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ................................ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද අංක..................................... දරන, නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස්........................................... විසින් තීරණය කරන ලද ඉල්ලීමේ/පැමිණිල්ලේ ඉල්ලුම්කරු/ පැමිණිලිකරු/වගඋත්තරකරු/පාර්ශ්වකරු වෙමි.

2. ඉල්ලීමට/පැමිණිල්ලට අදාළ වන කෘෂිකාර්මික ඉඩම...............................ගොවිජන විනිශ්චය සභාවේ බලප්‍රදේශය තුළ පිහිටා ඇති බව ප්‍රකාශ කරමි.

3. අංක.............................. දරන ඉල්ලීම/පැමිණිල්ල පිළිබඳ තීරණය................. දින මා වෙත දැනුම් දෙන ලදී.

4. එකී තීරණයෙන් මා අතෘප්තියට පත්වී ඇති බැවින් මීට අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයේ ඇතුළත් කරුණු මත මේ අභියාචනය ඉදිරිපත් කරමි.

....................................................
ඉල්ලුම්කරුගේ/පැමිණිලිකරුගේ/වගඋත්තරකරුගේ/
පාර්ශ්වකරුගේ අත්සන.

12 වන නියෝගය.

*"ඈ" ආකෘතිය*

***නියෝජිතයෙකු පත් කිරීම***

................................................ වන මම, 2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන විනිශ්චය සභාව ඉදිරියේ පවත්වනු ලබන අංක.......................................... දරන පරීක්ෂණයේ දී මාගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට....................................................... මහතා/මහත්මිය/මෙනවිය පත් කරමි.

......................................
ඉල්ලුම්කරු/පැමිණිලිකරු/වගඋත්තරකරු
/පාර්ශ්වකරු/අභියාචක.

දිනය :..........................

13 වැනි නියෝගය.

*"ඈ" ආකෘතිය*

***නියෝජිතයාගේ පත්වීම අවලංගු කිරීම***

................................................ වන මම, 2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන විනිශ්චය සභාව ඉදිරියේ පවත්වනු ලබන අංක ..................................... දරන පරීක්ෂණයේදී/විභාග කටයුතු වලදී මාගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට....................................................... මහතාට/මහත්මියට/මෙනවියට දී තිබූ බලය මෙයින් අවලංගු කරමි.

......................................
ඉල්ලුම්කරු/පැමිණිලිකරු/වගඋත්තරකරු
/පාර්ශ්වකරු/අභියාචක.

දිනය :..........................

33 වැනි නියෝගය.

*"ඉ" ආකෘතිය*

2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 42 වගන්තියේ නියමයන් ප්‍රකාරව සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අභියාචනය

.......................................................................
.......................................................................
.......................................................................
අභියාචක,

.......................................................................
.......................................................................
.......................................................................
වග උත්තරකරු,

ගොවිජන විනිශ්චය සභාවේ පරීක්ෂණ අංකය :-.................
2013...................... දින දී ය.

2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ................................................ වගන්තියේ නියමයන් ප්‍රකාරව ගොවිජන විනිශ්චය සභාව විසින් ........................................... දින ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත් වූ හෙයින්, මේ සමග අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු මත මම මේ අභියාචනා පෙත්සම සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරමි.

.........................................
අභියාචකගේ අත්සන.

03-1148/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.